# මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය
# நிதி, திட்டமிடல் அமைச்சு
# MINISTRY OF FINANCE AND PLANNING

මහලේකම් කාර්යාලය, කොළඹ 01. ශ්‍රී ලංකාව.
செயலகம், கொழும்பு 01. இலங்கை
The Secretariat, Colombo 01 Sri Lanka

කාර්යාලය / அலுவலகம் / Office: 2484500, 2484600, 2484700
ෆැක්ස් / பெக்ஸ் / Fax: (94)-11 - 2449823
වෙබ් අඩවිය / வெப் சைட் / Website: www.treasury.gov.lk


මගේ අංකය / எனது இல. / My No.: PFD/RED/01/04/2014/01
ඔබේ අංකය / உமது இல. / Your No.:
දිනය / திகதி / Date: 2014.02. 17

රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක: 01/2014

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් ප්‍රධාන ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්
දිස්ත්‍රික් ලේකම්වරුන්
පළාත් පාලන ආයතන ප්‍රධානීන්
රාජ්‍ය ව්‍යාපාර හා ව්‍යවස්ථාපිත ආයතන ප්‍රධානීන්

**<u>රජයේ අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, රාජ්‍ය ව්‍යාපාර හා ව්‍යවස්ථාපිත ආයතනවල සංයුක්ත සැලැස්ම හා වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම</u>**

"මහින්ද චින්තන" ඉදිරි දැක්ම - රජයේ ආර්ථික සංවර්ධන රාමුව තුළ ජාතික ප්‍රතිපත්තීන් හා උපාය මාර්ගවලට අනුකූලව එක් එක් අමාත්‍යාංශය වෙත පවරා ඇති විෂයයන් හා කාර්යයන් යටතේ වාර්ෂිකව ඉටුකළ යුතු සංවර්ධන වැඩසටහන් සම්බන්ධව ගරු අමාත්‍යවරුන්, අමාත්‍යාංශ ලේකම්වරුන්, දෙපාර්තමේන්තු හා රාජ්‍ය ව්‍යවසාය ප්‍රධානීන් භාණ්ඩාගාර නිලධාරීන් සමඟ සාකච්ඡා කරමින් මධ්‍යකාලීන රාජ්‍ය මූල්‍ය රාමුවක් තුළ විස්තරාත්මක වාර්ෂික අයවැය ඇස්තමේන්තු සඳහා පාර්ලිමේන්තුවේ අනුමැතිය ලබා ගනු ලැබේ. එසේ අනුමත කරනු ලබන වාර්ෂික ඇස්තමේන්තු තුළ එක් එක් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු සැලසුම් ඇතුළත් කරනු ලැබේ.

02. රජයේ අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු ලාභ පදනමින් වාණිජ කටයුතු ඉටුකරනු ලබන ආයතන නොවන අතර, පාර්ලිමේන්තුව අනුමත කරන වාර්ෂික අයවැය ලේඛන මධ්‍යකාලීන අයවැය රාමුව තුළ ක්‍රියාත්මක කිරීමට බැඳී ඇති බැවින් වෙන වෙනම සංයුක්ත සැලසුම් (Corporate Plan) සකස් කිරීමේ අවශ්‍යතාවය පැන නොනගී. රජයේ ප්‍රතිපත්ති හා වැඩසටහන් මෙන්ම අදාල ආයතන වල දැක්ම හා මෙහෙවර අයවැය ඇස්තමේන්තුවල සඳහන් බැවින් අයවැය ඇස්තමේන්තු සකස් කිරීමේදී භාවිතා කළ වැඩසටහන් අනුමත ඇස්තමේන්තු වලට අනුකූලව සකස් කර ක්‍රියාත්මක කළ යුතු ය.

03. ඒ අනුව, සියළුම අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, දිස්ත්‍රික් ලේකම් කාර්යාල ප්‍රධානීන් විසින් තම ආයතන වෙනුවෙන් අනුමත අයවැය ඇස්තමේන්තු ක්‍රියාත්මක කිරීම සඳහා තුන් අවුරුදු මධ්‍යකාලීන අයවැය රාමුව තුළ නියමිත මුදල් වර්ෂයට අදල වාර්ෂික ක්‍රියාකාරි සැලැස්ම (Annual Action Plan) සකස් කළ යුතු ය. වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම තුළ පහත සඳහන් කරුණු අන්තර්ගත විය යුතු ය.

(අ) අදල වර්ෂයට යාවත්කාලීන කළ ආයතනයේ සංවිධාන ව්‍යුහය, අනුමත කාර්ය මණ්ඩලය සහ දැනට සේවයේ සිටින කාර්ය මණ්ඩලය පිළිබඳ විස්තර

(ආ) අදාල වර්ෂය තුළ වාර්ෂික අයවැය පදනම් කරගත් ප්‍රමුඛතා අනුව සකස් කළ ක්‍රියාකාරකම් සැලැස්ම (Activity Plan), ක්‍රියාත්මක කාල රාමුව (Time Line) හා එම ක්‍රියාකාරකම්වල අපේක්ෂිත නිමවුම් /ප්‍රතිඵල (Output/Outcome)

(ඇ) ආදයම් දෙපාර්තමේන්තු විසින් අයවැය ඇස්තමේන්තුවල සඳහන් එක් එක් ආදයම් ශීර්ෂයන් වෙනුවෙන් ආදයම් එකතු කිරීමේ ක්‍රියාකාරී සැලැස්ම

(ඈ) වාර්ෂික ක්‍රියාකාරකම් සඳහා වන අක්මුදල් අවශ්‍යතා සැලැස්ම (Imprest Requirement Plan)

(ඉ) සැලසුම් කර ඇති ප්‍රධාන සංවර්ධන වැඩසටහන් (ආයතන මෙහෙයුම් කටයුතු, ගොඩනැගිලි හා වාහන නඩත්තු සහ පුනරුත්ථාපන කටයුතු නොව) වෙනුවෙන් වන වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම (Annual Procurement Plan)

(ඊ) අභ්‍යන්තර විගණන සැලැස්ම (Internal Audit Plan)

04. පාර්ලිමේන්තු පනත් මගින් සංස්ථාපිත නියාමන ආයතන, ප්‍රවර්ධන ආයතන, අධ්‍යාපන ආයතන, සංවර්ධන හා පර්යේෂණ ආයතන වැනි ව්‍යවස්ථාපිත ආයතන ව්‍යවස්ථාපිත පනතේ අරමුණු අනුව කටයුතු කළ යුතු අතර එම ආයතන වල මූලික අරමුණ ලාභ ඉපයීම නොවන බැවින් සංයුක්ත සැලසුම් පිළියෙල කිරීමේ අවශ්‍යතාවයක් පැන නොනගින අතර දිගුකාලීන දැක්මක් සහිතව අදල පනතේ සඳහන් අරමුණු සාක්ෂාත් කරගැනීම ඉලක්ක කරගත් ක්‍රියාකාරකම් ඇතුලත් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් (Annual Action Plan) සකස් කළ යුතු ය. මෙම ක්‍රියාකාරී සැලැස්මට පහත සඳහන් කරුණු ඇතුලත් විය යුතුය.

(අ) අදල වර්ෂයට යාවත්කාලීන කළ ආයතනයේ සංවිධාන ව්‍යුහය, අනුමත කාර්ය මණ්ඩලය සහ දැනට සිටින කාර්ය මණ්ඩලය පිළිබඳ විස්තර

(ආ) අදල වර්ෂය සඳහා අයවැය ලේඛනය (රජයේ දයකත්වය, ආයතනයේ ඉපයීම් හා සමස්ත වියදම්)

(ඇ) අදල වර්ෂය තුල වාර්ෂික අයවැය පදනම් කරගත් ප්‍රමුඛතා අනුව සකස් කළ ක්‍රියාකාරකම් සැලැස්ම (Activity Plan), ක්‍රියාත්මක කාල රාමුව (Time Line) හා එම ක්‍රියාකාරකම්වල අපේක්ෂිත නිමවුම් /ප්‍රතිඵල (Output/Outcome)

(ඈ) ප්‍රධාන ප්‍රසම්පාදනයන් සඳහා වන ප්‍රසම්පාදන සැලැස්ම

(ඉ) භාණ්ඩාගාර ප්‍රතිපාදන මත ක්‍රියාත්මක වන ව්‍යවසායන් සම්බන්ධයෙන් වාර්ෂික ක්‍රියාකාරකම් සඳහා වන අක්මුදල් අවශ්‍යතා සැලැස්ම

(ඊ) අභ්‍යන්තර විගණන සැලැස්ම.

05. රාජ්‍ය වාණිජ ව්‍යාපාර (State Owned Business Enterprises)

1) තම ව්‍යාපාර කටයුතු කෙටිකාලීන හා දිගුකාලීන දැක්මක් සහිතව කළමනාකරණය කළ යුතු බැවින් අවම වශයෙන් වසර තුනක කාලයක් සඳහා සංයුක්ත සැලැස්මක් පිළියෙල කර ඒ අනුව යෝජිත ඉලක්ක ලඟාකර ගැනීමට හැකි වන පරිදි ව්‍යාපාරය මෙහෙයවීම අධ්‍යක්ෂ මණ්ඩලයේ පූර්ණ වගකීම වේ. එම සංයුක්ත සැලැස්ම පිළියෙල කිරීමේදී පහත සඳහන් කරුණු පිළිබඳව අවධානය යොමු කළ යුතු අතර සංයුක්ත සැලැස්ම අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය සහිතව අදල අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ අනුමැතිය සඳහා ඉදිරිපත් කළ යුතු ය.

(අ) රජය වෙනුවෙන් ඉටුකරන සංවර්ධන කටයුතු හා ව්‍යාපාරික වශයෙන් ඇති වාණිජ කටයුතු වෙන වෙනම හඳුනා ගනිමින් ව්‍යාපාරයේ ස්ථාපිත අරමුණු ඉටුකර ගැනීම සඳහා ව්‍යාපාරය තුළ ඇති ශක්තීන් (Strengths) මෙන්ම දුර්වලතා (Weaknesses) මනා

ඇගැයීමට ලක් කරමින් අවශ්‍ය පරිදි යාවත්කාලීන කර ඉදිරි වර්ෂ සඳහා අඛණ්ඩව ගෙන යාම

(ආ) ව්‍යාපාරික පරිසරයේ ඇති අවස්ථාවන් (Opportunities) හා බාධක (Threats) මනා ඇගැයීමකට ලක් කිරීම

(ඇ) ව්‍යාපාරික අරමුණු ඉටුකර ගැනීම සඳහා උචිත ක්‍රමෝපායන් (Strategies) හඳුනාගැනීම

(ඈ) කාලීනව ලඟාකර ගතයුතු ඉලක්කයන් (Targets) ස්ථාපිත කිරීම හා එම ඉලක්කයන් සපුරා ගැනීමේ වගකීම මෙහෙයුම් මට්ටම දක්වා තර්කානුකූලව බෙදහැරීම

2) එසේම, මෙම ව්‍යාපාරික සැලැස්ම පදනම් කරගෙන ඉදිරි මුදල් වර්ෂයේදී ක්‍රියාවට නැංවීමට අපේක්ෂිත වාණිජ ක්‍රියාකාරකම් ඇතුලත් ක්‍රියාකාරී සැලැස්මක් (Action Plan) පිළියෙල කළ යුතු අතර, එයට පහත සඳහන් කරුණු අන්තර්ගත විය යුතු ය.

(අ) වාර්ෂික අයවැය ලේඛනය (ආදායම්, මෙහෙයුම් වියදම්, සංවර්ධන වියදම්, මූල්‍ය තත්ත්ව ප්‍රකාශය, මුදල් ප්‍රවාහ ප්‍රකාශය ද ඇතුළුව)

(ආ) යෝජිත ප්‍රධාන ආයෝජන, ධාරිතා පුළුල් කිරීම් (Capacity expansions), ප්‍රධාන ප්‍රසම්පාදනයන් (Major Procurements) ඇතුලත් වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම

(ඇ) මානව සම්පත් සංවර්ධන සැලැස්ම (Human Resource Development Plan)

(ඈ) ණය ආපසු ගෙවීමේ සැලැස්ම (අදාල වන පරිදි)

(ඉ) අභ්‍යන්තර විගණන සැලැස්ම

05. ඒ අනුව, සංයුක්ත සැලසුම් සකස් කිරීම සම්බන්ධයෙන් නිකුත් කරන ලද රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක PF/R/2/2/3/5 (4) හා 2010.03.10 දිනැති ලිපිය සහ 2007.12.18 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක PED 47 මෙයින් අවලංගු කෙරෙන අතර 2014 සිට මෙම චක්‍රලේඛයේ සඳහන් උපදෙස් පරිදි අදල සැලසුම් සකස් කර ඉදිරිපත් කළ යුතුය.

06. 2014.03.01 දින සිට බලපැවැත්වෙන පරිදි මෙම චක්‍රලේඛය නිකුත් කරනු ලැබේ.

පී.බී. ජයසුන්දර
භාණ්ඩාගාරයේ ලේකම්

පිටපත: විගණකාධිපති